කරගනිමින් ම ඈ දොර ඇරියා ය.

''මිස් .. . කෝපි ..''

''කුමාර.. කියවද ආවෙ..?'' නිෂාධි බන්දේසියෙන් කෝපි කෝප්පය අතට ගන්නා අතර ඇසුවා ය.

''හවස හතර විතර වෙද්දි ෂූරිං ඉවර වුණා මිස්.. ''

''ඇයි..?''

''වැස්ස නිසා... ඒත් සමගරු කිව්වෙ අනුරාධ අයිය ඩිරෙක්ටර්ට කියලා නවත්තන්න ඇති කියලයි..''

''ඇයි..?''

''මන්දා.. අද අනුරාධ අයියා හොඳට රගපෑවෙ නැහැලු..''
''ඇයි..?''

''මන්දා... .. මිස් කාරණයක් කියන්න ද..?''

''..?''

''මිස් ගියාට පස්සෙ හැමෝම අනුරාධ අයියට හිනා වුණා.. ඔං හිතන්නෙ අනුරාධ අයියට ඒකට අප්සෙට් වෙන්න ඇති.. මටක් දුක හිතුණා... ඇයි මිස් කතා නොකරම ගියේ..?''

සිතේ බර දෙගුණ වූවා සේ නිෂාධි ට දැනුණි. ඈ කිසිවක් නොකිවා ය. දොර වසා දැමූ ඈ කෝපි කෝප්පය අත සෝදා බේසමට හැළුවා ය. කෝපි සෙදී යන තෙක් කරාසය ඇර දැමූ ඈ කණ්ණාඩියෙන් පෙනෙන මුහුණට එබී බැලුවා ය. දෙස් කඳුළක දැණුසුමින් දැවී යන ඇසට දැනුණි. සීතල වතුර දෝතක් ගත් ඈ තම මුහුණ එහි ඔබාගෙන සිටියා ය.

වැස්ස නැවතී ඇත. විලෝ ගස් මත රැළුණ දිය බිඳු සුළඟින් සැලිතව බිමට වැටෙනු ඇසෙයි. ඈද මත වාඩි වී කොට්ටයක් උකුළ මත තබාගත් ඈ බොහෝ වේලා කල්පනා කරමින් සිටියා ය.

නිෂාධි පහළට එන විට ඈත ගඟරයේ තැනින් තැන විදුලි පහන් තම දෙක දැල්වෙන්නට පටන් ගෙන තිබුණි. එළිමහනට ගොස් ඒ දෙස බලා සිටින්නට ඇයට සිතුණි. හෝටලයේ විසල් මහ දොරින් ඈ උදානනයට බැස්සා ය. හමා ගිය සීත සුළඟ විඳුරු කටු සේ ඇගේ මුහුණත වැදුණි. උඩට ඇද සිටි ස්ට්‍රවරයේ කොළවය ඔසවා මුහුණ ඇඩක් වසා ගන්නා අතර තුර ඈ ඔහු දුටුවා ය.

''අනුරාධ... ..'' ඈ තමාටම මුමුණා ගත්තා ය.

ඇඩක් නිම කළ බිරා විඳුරුව ඔහු ඉදිරියේ වූ කුඩා මේසය මත විය. ඔහු සිටියේ සීතලේ ගැහෙමිනි. එතැනට ගොස් ඔහු අමතන්නට ඇයට ඇවැසි විය. එනමුදු ඒ සැඳහා ඇති තරම් යෙදේරියක් ඇයට නොවී ය.

ඈත කඳු පෙළ දෙස අනිමිස ලෝචනයෙන් බලා සිටියදු ඔහු තමා ඉදිරිපස වූ විශ්වාස ය. ඔහු ඒ දසුනින් දෙස් මෙත් කර තමා දෙස බලා ...නිෂාධි.. යි අමතනු ඇතැයි ඈ බලාපොරොත්තු දළිවාගෙන බලා සිටියා ය.

0000000

බිරා විඳුරුව තමා හිතුවාට වඩා සීත උණුසුම් කළ බවක් අනුරාධට දැනුණි. දකුණ පිසු වූ සියල්ල අමතක කර දමන්නට එය විශාල පහසුවක් වනු ඇතැයි ඔහුට සිතුණි. සැන්දෑ කලුවර ඔැදින් හමා ආ ගෙන බරින සුළඟේ ඇඟ කීරි ගැස්වන සීතල ඔහුට දැනුණ ද එය නොතකා ඉන්නට තරම් ඔහු සිත දඬබිබර විය.

අතමඬයකින් තම සිතට ඇතුළුව වද දුන් නිෂාධි නම් වන ආගන්තුක තරුණිය තම සිතින් සැහවාමම පන්නා දමා තමාව හුරු පුරුදු හුදකලා පිරිතසට සමවෙළඳන්නට ඔහුට ඇවැසිවා තිබුණි. ගෙවුණ යුගය විසින් හැදවෙන් පත්ලේ ඉතිරි කර දමනු ලැබ තිබුණ අසිමි ආදරයක පුපුරුදු වේදනාව සදාකල්හිම විඳින්නට -නතිවම විඳින්නට- ඔහු සිත හදා ගනිමින් සිටියේ ය.

නිෂාධි හෝටලයේ ඉදිරි දොරින් ඉවතට එනු ඔහු පසහැඳිළිව දුටුවේ ය. එනමුදු ඈ දෙස නොබලා සිටින්නනෙසැයි ඔහු සිතුවේ ය. එය කෙරහිම අපහසු දෙයක් දැයි ඔහු ඉතා ඉක්මණින්ම තේරුම් ගත්තේ ය.

විඳුරුවේ අවසන් බිරා උතුර පානය කළ අනුරාධ හෝටලය තුළට යාමට නැතී සිටියේ තව දුරටත් තම සිත දැඩි කරගෙන සිටින්නට නොහැකි වන බව දැනුණා බැවිනි. නිෂාධ අසලින් පිය මෙන යැදී අයෙන් සුවඳ ඔහුට නොදැනුණා නොවේ. පෙර දා ලෝකාන්තයේදී ඈ මිනිරි සුවඳ කෙසේ නම් මඟ හැර යන්න ද? සිත නැවත දුර්වල වෙයි. එනමුදු තව දුරටත් ඒ දුර්වල කමට ඉඩ දිය යුතු නොවේ.

අනුරාධ නිෂාධි දෙස නොබලා ම හෝටලය තුළට ගියේ ය. ඇගේ නිල් දෙනයන තමා දෙසටම යොමුව තිබෙන බව දැකැ දැකම ඔහු ඈ අසලින් ම ඇවිද ගියේ ය.

ඇඳේ වැතිරුණ ද අනුරාධ කරා නින්ද අවේ නැත. ඇඳ ඉහත්තාවේ දැල්වෙන කුඩා විදුලි පහනනේ මඳ ආලෝකයෙන් ඔහු අත් ඔරලෝසුව දෙස බැලුවේ ය. නැවතත් මඟ වැස්ස ඇඳ වැටෙන්නට පටන් ගෙන ඇත.

ඇඳෙන් නැගිට ජනේලය අසලට ගිය ඔහු ජනෙල් පියන් විවර කර සීතල සුළඟට කාමරයට වැදෙන්නට ඉඩ දුන්නේ ය. හඳවතින් හඬා වැටෙමි- න් නිදි නැතිව රෑ කියන් නම් ගෙවෙන්නට ඇද්ද? මේ තවත් එවන් රැයක් පමණක් නොවේ ද?

ජීවිතේ අතර මඟ නැවතුමක අව දෙදෙන සිටි බවක් මතක ඇත ඉතිරි කර සෙනෙහසක මුදු සුවඳ සිහින මල් පරවේ ය සිත තුළ ම

තරකා නිවී ගිය වෙලාවක සඳ නුබට තනි කමක් දැනේවි ද? හුදකලා මේ ගමන නිමාවන දිනේ මා ළඟින් අය සිටිවි ද.

කිසිවකු සිහින් හඬින් දොරට සන් කරනු අනුරාධට අසුණි. ඔහු දොර ඇරීමේ දෙවන පිනාවටත් ඒ හඬ අසා සිටියාට පසුව ය.

විවර වූ දොර ඉදිරියේ දෙවි දුවක සේ ඈ බලා සිටිණු ඔහු දුටුවේ ය.

''නිෂාධි'' අනුරාධ මිමිණුවේ ය.

ඔහු අයට අතුළුවන්නට දොර අසලින් මෙත් වූයේ ය. ඒ ආරාධනය පිළිගත්තා සේ ඈ කාමරයට අතුළු වූවා ය.

''නිෂාධි'' ඔහු සෙමින් කීවේ ය. ඈ ගිස ඔසවා ඔහු දෙස බැලුවා ය. ඇගේ නිල් දෙනයන කඳුළින් පිරී තිබෙනු ඔහු දුටුවේ ය.

''අ... අනුරාධ... ස...මා...වෙ..න්..න..'' ඈ බොහෝ අපහසුවෙන් කීවා ය. සිහින් කඳුළු බිඳු දෙකක් ඇගේ දෙකාපුල් ඔස්සේ ගලා යනු ඔහුට පෙනුණි. අය ඉකිබිඳිනු ඔහුට අසුණි.

''ම. පා.'' ඔහු මිමිණුවේ ය.

ඈ දෝතින් සිය මුහුණ වසා ගත්තා ය.

ඔහු සිය දෑතින් ඇගේ දෙදරහිස් අල්ලා ගත්තේ ය. ඈ සුළඟේ සැළෙන නා දැල්ලක් සේ පාව අවුත් ඔහුගේ පපුතරයේ හිස හොවා ගත්තා ය. ඇගේ කඳුළේ සිසිල ඔහුගේ පපුව මත තැවරැණි. ඔහු මගත් වූ ස්නේහයකින් අයගේ හිස සිප ගත්තේ ය. මේ දැසතන්නේ ආත්ම ගණනක් පුරා ආදරයේ සුවඳ නොවේද? මේ සිහිනයක් නම් මේ සිහිනයට පළා යන්නට ඉඩ දිය යුතු නොවේ.

අනුරාධ කාමරයේ දොර වැසුවේ ය.

ප්‍රමත කළාපයට

හුග කාලෙකට පස්සෙ අල්ලපු ගෙදර නංගිගෙන් කෝල් එකක්.

-අනේ අක්කෙ තරහ වෙන්න එපා පසුගිය දවස් වගේම වැඩ කටයුතු ඉහරන් උඩින් ගිහිල්ලයි තිබුනෙ. ඒකයි කෝල් එකක් වත් දෙන්න බැරිවුණේ" නංගිගෙ කට හඬේ නම් තිබුනෙ වෙනද උද්යෝගයමයි.

-මොකද විහාරයක් හෙම ලඟදි තිබුනද?" මං ඇහැව්වෙ එයා පෝෂණය ගැන පාඨමාලාවක් හදරන බව මතක් වුනු ගින්දයි. මේ මනුෂ්‍යය දරුවො දෙන්නෙකුත් බලා හදලගෙන කොහොම ඉගෙනිම වැඩ කරනවද මන්ද?

-මම් අක්කෙ, විශේෂ විද්‍යාලයට පර්යේෂණ වාර්තාවක් දෙන්න තිබුන. ආයෙ ටික දවසකට ඒ කරදර නම් නෑ. මං මේ කතා කළේ අක්කලගෙ අම්මේ ගෙදර බලන්නත් එක්ක අපි එන්නම්කො හෙට හවසට ඇවිත් එන්න කියල කියන්නයි."

-අනේ නංගි මොන අළුතක්ද? අපි ඔස්ට්‍රේලියාවෙ ඉන්න පස්වෙනි ගේ තමයි මේ" මම කිව්ව. -කමක් නෑ, එහෙනම් නංගිල එන්න රෑට කන්නත් එක්ක."

-අනේ බෑ අක්කෙ, රෑ කෑමට යන්න තියෙනව සිරිගෙ යාළුවකුගෙ ගෙදර ඔය පැත්තෙ, ඒ යන ගමන් හවසට ගොඩ වෙලා යන්න එන්නම්."

-එහෙනම් දමුම් යන ගමන් තලගොයිත් මරාගන්නයි අදහසද?" මං කිව්වෙ හිනා වෙව්.

* * *

අල්ලපු ගෙදර නංගි කියල කිව්වෙ පරණ පුරුද්දට. අවුරුදු දහයකට ඉස්සර අපි හිටපු තරිදු තිවාස පෙළේම ගෙදරකටයි අළුතින් ඉංජනයර් වුණු ඇවිත් ශ්‍රීපාලියි සිරිසි පදිංචි වුණේ.

ශ්‍රීපාලි පොඩි කෙල්ල. ලංකාවෙ කෙනෙක් නිසා වැඩිගිරි කමට එයා මට අක්ක කිව්ව. අපේ එක්කෙනා, නිමල්ට අයිය කිව්ව. මමත් ඉතිං ශ්‍රීපාලිට අල්ලපු ගෙදර නංගි කියන්න පටන් ගත්ත.

දැන අපි සපතුම් විස්සක් දුරින් හිටියත් තවම ශ්‍රීපාලි අල්ලපු ගෙදර නංගි. මං අල්ලපු ගෙදර අක්කා.

* * *

කිව්ව වගේම හවස පහමාරට විතර මන්ත දෙරට තරිදු කරන හඬක්. ශ්‍රීපාලියි, සිරිසි, පොඩ්ඩො දෙන්නයි දොර ළඟ.

-එන්න එන්න සිරි, එන්න ශ්‍රීපාලි. අයියෝ! සපත්තු ගලවන්න කරදර වෙන්න එපා" අපේ එක්කෙනා කිව්ව. -අපේ ගෙදර බබාලු ඉන්නවැයි?" අපේ උන් දෙන්නම දැන් යුනිවර්සිටි එකේ.

-හඳ, නෑ, එහෙම හරි හැසිනෙ. සිරි මේ නිලුමෙග සපත්තුත් ගලවන්න" ශ්‍රීපාලි සිරිට කිව්ව.

-ඕහොල්ලො දන්නවනෙ සපත්තු ගැලවීම පිළිබඳ ගෝල්ඩන් රූල් එක? කරිරු හරි අපේ ගෙදරට එනකොට එපා කියද්දිම සපත්තු ගලවල ආවොත් අපිත් ඒ කරිරියගෙ ගෙදර යනකොට සපත්තු ගලවන්නම ඕනෑ" අපේ එක්කෙනා හිනාවෙනව. අපේ එක්කෙනාගෙත් හොඳ හොඳ ප්‍රතිපත්ති තියෙන්නෙ. එයා කො- හේදේ ගැලෙව්වත් දුම්කන්දුමෙග ගෙදර ගියාම නම් සපත්තු ගලවන්නෙම නැති බව මට මතක් වුනා. දුම්කන්දත් එහෙමමනෙ. වවුලගෙ ගෙදර ගියාම වවුල වගෙ ඉන්න ඕනෙලු.

-හැබැයි මේක අපි ඔස්-ලාංකිකයො අතර විතරයක් තියෙන පන්සල් වාරිත්‍රයක් නෙමේ. මං කාලෙකට ඉස්සර ඉන්දියන් ගෙදරකට ගියා, ඒ ගේ ඉස්සරහ දොර ළඟ ගෙදර ගඳනු කෙනා දැන්වීමක් ගහල තිබුන, සපත්තු ගලවල ආවොත් එයාගෙ වැඩ ලේසි වෙනව කියල." මමත් කතාවට දායක වුනා.

-ඒ විතරක් නෙමේ. ඇයි මතකද අර කර්ම යුවර් එන්තුසියසම් කියන අයවෙසෙන් ටෙළි කතා පෙළඳත් එක එපිසෝඩ් එකක ගියේ ගෙදරකට ගිහිල්ල සපත්තු ගලවන්න නැතුව යන ගෝරියක්". ඒ සිරි.

කොහොමින් කොහොමින් හරි කරිරියම ගෙදර ආපුහොත් ආවෙ සපත්තු සේරම ගලෝල මේස් පිටින්.

* * *

වාඩිවෙන්න, වාඩිවෙන්න මම විසිත්ත කාමරේ පුටු පෙළට අත දික් කළා.

-මොකද මෙහෙන් වාඩි වෙන්න කිව්වෙ අපි මේ ගෙදරට අමුත්තොද අක්කා?" අල්ලපු ගෙදර නංගි අහපි.

-ඒ මොකද නංගි එහෙම කිව්වෙ?" මං ඇහැව්වෙ පුදුමයෙන්.

-නෑ ඉතිං, මෙහෙ අපේ අයගෙ සාමාන්‍ය සිරිත අනුව, අළුත් යාළුවොයි, අමුත්තොයිනෙ, ගෙදර ඉස්සරහ පුටුවල වාඩිවෙන්නෙ. පරණ යාළුවො කෙලින්ම යන්නෙ කුස්සිය පැත්තෙ පුටු වල වාඩි වෙන්නනෙ."

-නංගිගෙ කතාව අත්ත නේන්නම්. අපේ සමහර යාළුවන්ගෙ ගෙවල් වල අපි සාලෙ ඉඳගෙනමම නැහැ කවදාකවත්" මට කියනුනා.

-ගෙදරකට ගිහිං වාඩිවෙන්නෙ කොයි පුටු වලද කියන එක එහනම් යාළු කම මනින මිණුම් දණ්ඩක්?" අපේ එක්කෙනාගත් මේක අළුත් අත්දැකීමක් වගේ.

-හැබැයි මෙහෙ අපේ අයගෙ ගෙවල්වල කොච්චර කළත් ලංකාවෙ ගෙවල්වල වගෙ සාලෙ පුටු සෙට් එකට රෙදි පෙරෝලු වගල තියන්නෙ නැති එක නම් ලොකු දෙයක්". කරිරියටම ගිනා සිරි ගෙ ඒ කතාවට.

-සුදුසු අසුනක් බලලු පෝඩුව වාඩි වෙන්නකො එහෙනම්" මං කිව්ව.

අල්ලපු ගෙදර නංගි කෙලින්ම ගියේ කුස්සියෙ කෑම කාමරේ මේසෙටයි. අපි හොඳ යාළුවො!!!

අල්ලපු ගෙදර අක්කා

අල්ලපු ගෙදර නංගිගෙ බී.වයි.ඕ. කිරි ටොෆි ගැන ලබන කලාපයෙන් කියවන්න.